
**<u>සිතියම් අංක 18: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි කලාප</u>**

ග්‍රාම නිලධාරී වසම් 39 කින් යුත් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ජාතික සමෘද්ධි වැඩසටහනේ පරිපාලනමය කටයුතු වල පහසුව මෙන්ම සේවාලාභීන් වෙත වඩාත් කාර්්යක්ෂම හා ඵලදායී සේවයක් සැපයීමේ අරමුණින් ප්‍රධාන වශයෙන් සමෘද්ධි කලාප 03 කට බෙදා වෙන් කොට ඇත. එනම්,

- දෙල්ගමුව සමෘද්ධි කලාපය - ග්‍රාම නිලධාරී වසම් 14 කින් යුක්තයි
- කුරුවිට සමෘද්ධි කලාපය - ග්‍රාම නිලධාරී වසම් 14 කින් යුක්තයි
- නාමල්දෙණිය සමෘද්ධි කලාපය - ග්‍රාම නිලධාරී වසම් 11 කින් යුක්තයි

මෙම තොරතුරු පහත සිතියම් අංක 18 මගින් පෙන්වා දී ඇත.

**සිතියම් අංක 18** **කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි කලාප**




## සිතියම් අංක 19: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවිජන සේවා කොට්ඨාස

පරිපාලනමය කටයුතු වල පහසුව, සේවාලාභීන් වෙත වඩාත් කාර්‍යක්ෂම මෙන්ම ඵලදායී සේවයක් සැපයීමේ අරමුණින් ගොවිජන සේවා කොට්ඨාස වෙන් කර ඇති අතර, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 39, ගොවිජන සේවා කොට්ඨාස 03 කට අයත්ව ඇත. එම තොරතුරු පහත සිතියම් අංක 19 මගින් පෙන්වා දී ඇත. ඒ අනුව,

- කුරුවිට ගොවි ජන සේවා බල ප්‍රදේශය - ග්‍රාම නිලධාරී වසම් 25 කින් යුක්තයි
- නාමල්දෙනිය ගොවි ජන සේවා බල ප්‍රදේශය - ග්‍රාම නිලධාරී වසම් 11 කින් යුක්තයි
- දොඩම්පේ ගොවි ජන සේවා බල ප්‍රදේශය - ග්‍රාම නිලධාරී වසම් 03 කින් යුක්තයි

**සිතියම් අංක 19 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවිජන සේවා කොට්ඨාස**



## සිතියම් අංක 20:        කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රෙජිස්ට්‍රාර් කොට්ඨාස

ශ්‍රී ලංකාව තුල බ්‍රිතාන්‍ය පාලන සමයේ සිටම රෙජිස්ට්‍රාර් කොට්ඨාස වෙන් කර ඇති අතර වර්තමානයේ රට තුල ක්‍රියාත්මක ප්‍රාදේශීය පරිපාලනය හසුරුවාලීමට හැකි වන අයුරින් මෙම රෙජිස්ට්‍රාර් කොට්ඨාසයන්ද වෙන් කර ඇත. එමගින් සේවාලාභීන් වෙත වඩාත් කාර්්‍යක්ෂම මෙන්ම ඵලදායී සේවයක් සැපයීම ද අරමුණු කරගෙන ඇති අතර, ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 39, රෙජිස්ට්‍රාර් කොට්ඨාස 07 කට අයත්ව ඇත. එම කොට්ඨාස 07 අතුරින් පනාවල කෝරලේ බටහිර රෙජිස්ට්‍රාර් කොට්ඨාසය තුල රාජකාරී ආවරණය කරනුයේ කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මගින් වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. එම තොරතුරු පහත සිතියම් අංක 20 මගින් පෙන්වා දී ඇත. ඒ අනුව,

- එල්ලාවල රෙජිස්ට්‍රාර් කොට්ඨාසය - ග්‍රාම නිලධාරී වසම් 03 කින් යුක්තයි
- පුස්සැල්ල රෙජිස්ට්‍රාර් කොට්ඨාසය - ග්‍රාම නිලධාරී වසම් 04 කින් යුක්තයි
- තෙප්පනාව රෙජිස්ට්‍රාර් කොට්ඨාසය - ග්‍රාම නිලධාරී වසම් 07 කින් යුක්තයි
- එරත්න රෙජිස්ට්‍රාර් කොට්ඨාසය - ග්‍රාම නිලධාරී වසම් 05 කින් යුක්තයි
- තැඹිලියන රෙජිස්ට්‍රාර් කොට්ඨාසය - ග්‍රාම නිලධාරී වසම් 16 කින් යුක්තයි
- දොඩම්පෙ රෙජිස්ට්‍රාර් කොට්ඨාසය - ග්‍රාම නිලධාරී වසම් 01 කින් යුක්තයි
- පනාවල කෝරලේ බටහිර රෙජිස්ට්‍රාර් කොට්ඨාසය - ග්‍රාම නිලධාරී වසම් 03 කින් යුක්තයි

**සිතියම් අංක 20:** **කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රෙජිස්ට්‍රාර් කොට්ඨාස**

